# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,706 — 1966 ජූලි 29 වැනි සිකුරාද — 1966.7.29**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකට අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 113 |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 113 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍රවිනිශ්චයකාර ධුරන්දර මිලියානි ක්ලෝඩ් සන්සෝනි වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා, එයට සෑහෙන කරුණු පෙනී, 1966 දෙවැනි නැගෙණහිර චාරිකාව සඳහා මඩකලපුවේදී පැවැත්වීමට නියමිත ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාරය වෙනුවට 1966 අගෝස්තු මස 24 වැනි බුද දින සිට ත්‍රිකුණාමලයේ අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

ඇම්. සී. සන්සෝනි,
අග්‍රවිනිශචයකාර.

1966 ජූලි මස 21 වැනි දින,
කොළඹදීය.

7-1595

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### මධ්‍යම පළාත

#### කොළඹ දිස්ත්‍රික් උසාවියේදීය

කොළඹ ලංකා සේවිංස් බැන්කුවේ අධ්‍යක්ෂක මණ්ඩලය
........................................................................ පැමිණිලිකරුවෝ.

අංකය : එම්බී/7405 එදිරිව

නුවරඑළියේ බඹරකැලේ "මනෝරම්" හි පදිංචි අහන්ගම විතානගේ දොන් ගුණරාම රාජා සෙනෙවිරත්න..............විත්තිකරු.

මෙහි පහත සඳහන් දේපල, ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනය ද, රු. 38,606.71 සහ රු. 35,159.76 ට 1963 ජූලි මස 1 වැනි දින සිට ගෙවා නිමවනතුරු නීති පොලියද නඩු ගාස්තු වශයෙන් රු. 609.78 ක්ද, අනිකුත් සියළුම වියදම් සහ පිස්කල් ගාස්තු ද අයකර ගැනීමට 1966 අගෝස්තු මස 27 වැනි දින පෙරවරු 11ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

**පළමුවැනි උපලේඛනය**

මධ්‍යම දිසාවේ කලින් නුවරඑළිය නගරය සහ පළාත් ආණ්ඩු සභාව තුළ දැනට නුවරඑළිය දිස්ත්‍රික්කය සහ නගර සභාව තුළ බඹරකැලේ පිහිටි fපිලිප් ජේජක්, අවසරලත් මිනින්දෝරු තැන මැන සාදා තිබෙන 1939 අප්‍රේල් 4 වැනි දින දරණ පැලැනේ "බෝර්ලම් සහ ග්‍රවුන්ඩ්ස්" නම් ඉඩමේ අංක 7 දරණ කට්ටියේ

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

**1966 ජූලි මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනිහත්පත්තුවේ උඩුකහ බස්නාහිරකෝරළේ මැටියගනේ, සහ වැළඹ පිහිටි වැළඹ කහට වැටියේ නොහොත් උපකන්ද හේන නම් අක්කර 2, රූඩ් 2 ක් විශාල ඉඩමට මායිම්: උතුරට: දෙවටපාර සහ දියබස්නා ඇළද; නැගෙනහිරට: ඇම්. ඒ. පී. ඩබ්ලිව්. පී. සේනානායකට අයිතිව තිබුනු ඉඩමටද; දකුණට: වර්ජින් පෙරේරාට අයිති කහට වැටියේ හේන හෙවත් උපකන්ද හේනේ කොටසට වැටද; බස්නාහිරට: ජූලිස් පෙරේරා අප්පුහාමිට තිබී ඇතට ඇම්. ඊ. පෙරේරාට අයිති ඉඩමද, මායිම්වූ ඇප් 401/110 ලියාපදිංචි වී ඇති ඉඩම හා ඊට අයිති වැවිලි ආදී සියලුදේද.

2. ඉහතකී මැටියගනේ සහ වැළඹ පිහිටි පිස්කල් වත්ත නමැති අ. 3, රූඩ් 3, පර්. 15 ක් විශාල ඉඩමට මායිම් උතුරට සහ බස්නාහිරට: ඒ. පී. ගුණතිලකට අයිතිව තිබී දූනට ඇම්. ඊ. පෙරේරාට අයිති ඉඩමද; නැගෙනහිරට: ගම්සභා පාරද; දකුණට: ඇම්. ඒ. ජූලිස් පෙරේරාට බෙදුනු දූනට ඇම්. ඊ. පෙරේරාට අයිති පිස්කල් වත්තේ බී කොටසද මායිම් වූ ඇප් 535/94 ලියාපදිංචි වී ඇති ඉඩම සහ ඊට අයිති වැවිලි ආදී සියලුදේද වේ.

3. ඉහතකී මැටියගනේ සහ වැළඹ පිහිටි ඉදුරුපිල්ලෑව අක්කර 3 ක් විශාල ඉඩමට මායිම්: උතුරට: කපුරුහාමි ආරච්චිලට තිබී දූනට ඇම්. ඊ. පෙරේරාට අයිති ඉඩමද; නැගෙනහිරට: වැව් බැම්මද දකුණට: මයි අප්පුට තිබී ඇතට ඇම්. ඊ. පෙරේරාට අයිති ඉඩමද; බස්නාහිරට: මයිඅප්පුට තිබී ඇතට ඇම්. ඊ. පෙරේරාට අයිති කුඹුරද; මායිම් වූ ඇප් 396/184 ලියාපදිංචි වී ඇති ඉඩමද වේ.

අයකිරීමට තිබෙන මුදල රුපියල් 6458 ක්ද තාඩු ගාස්තුව රු. 723.22 හා පිස්කල් ගාස්තුයනාදියත්

ලයනල් අ. පොතුහැර,
වයඹ පලාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ජූලි මස 15 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

7-1479

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අයවෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකල යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහ ලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින් ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1966**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | ... | 66. 8. 5 | සිකුරාද | ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.12 | සිකුරාද | ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජූලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

**බර්නාඩ් ද සිල්වා,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි